# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1921/54 - 2015 ජූලි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ගාමිණී ජයවික්‍රම පෙරේරා (පා.ම.),
ආහාර සුරක්ෂිතතාව අමාත්‍ය.

2015 ජූනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

මෙම නියෝග මිනුම් ඒකක ප්‍රමිති හා සේවා නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2007 මැයි 29 දින ප්‍රසිද්ධ කරන ලද අංක 1499/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 60 වගන්තිය යටතේ පැනවූ නියෝග පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**1. කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ විභාග කිරීම, සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම, සත්‍යාක්ෂණය කිරීම හා මුද්‍රා තැබීම**

1.1 මෙහි I වැනි උපලේඛනයේ I කොටසින් නියම කර ඇති අගයනට අනුව කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ පරීක්ෂණය හෝ සත්‍යාක්ෂණය සඳහා ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

1.2 සත්‍යාක්ෂණය කළ සෑම කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණයක් සඳහාම එම උපකරණයේ අනුක්‍රමික අංකයක් තිබේ නම් අනුක්‍රමික අංකය, මාදිලිය ආදිය සහ ගෙවූ මුදල සඳහන් කළ සත්‍යාක්ෂණ සහතිකයක් නිකුත් කළ යුතුය. පාවිච්චි කරන අය මෙම සහතිකය උපකරණය සමග සුරක්ෂිතව තබාගෙන යම් බලය ලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඕනෑම අවස්ථාවක ඉල්ලූ විට ඉදිරිපත් කළ යුතුය.

1.3 අවස්ථානුකූලව අදාල නියෝගවලට අනුකූලව වන හා නිවැරදි වන සෑම කිරුම් පඩියක්, මිනුමක් සහ කිරුම් මිනුම් උපකරණයක්ම I උපලේඛණයේ II කොටසේ සඳහන් නියමිත සලකුණ යෙදීම හෝ මුද්‍රා තැබීම කළ යුතු ය. එසේ ලකුණු කිරීමට අමතරව වර්ෂයේ අවසාන ඉලක්කම් දෙක සහ මාසය දක්වෙන ඉලක්කම්වල මුද්‍රා ලකුණ යෙදිය හැකි නම් එසේ කළ යුතු ය.

**2. කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිණුම් උපකරණ ආදය නිෂ්පාදනය කරන, ආනයනය කරන, විකුණන සහ අලුත්වැඩියා කරන පුද්ගලයන් හා ආයතන ලියාපදිංචි කිරීම.**

2.1 යම් කිරුම් පඩියක්, මිනුමක් හෝ කිරුම් මිනුම් උපකරණයක්, නිෂ්පාදනය කරන, ආනයනය කරන, විකුණන සහ අලුත්වැඩියා කරන සෑම ආයතනයක්ම හා පුද්ගලයෙක්ම අධ්‍යක්ෂ විසින් නිශ්චය කරන ආකෘති පත්‍රයක් මගින් ඉල්ලීමක් කළ යුතු අතර මෙහි 2 වන උපලේඛනයේ I කොටසේ නියම කර ඇති ගාස්තුවද ඒ සමගම ගෙවිය යුතු ය.

2.2 යම් කිරුම් පඩියක්, මිනුමක් හෝ කිරුම් මිනුම් උපරකණයක්, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වූ සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක්ම

(අ) මෙහි 2 උපලේඛනයේ II කොටසේ ආකෘති පත්‍රයට අනුව සකස් කරගත යුතුය.

(ආ) එය නිකුත් කරන වසරේ දෙසැම්බර් මස 31 වන දිනට අවලංගු විය යුතුය.

2.3 යම් කිරුම් පඩියක්, මිනුමක් හෝ කිරුම් මිනුම් උපකරණයක් නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ලියාපදිංචි වීමට ඉල්ලුම් කරන සෑම පුද්ගලයෙකුම එවන් උපකරණ නිෂ්පාදනය පිළිබඳව හෝ අලුත්වැඩියා කිරීම පිළිබඳව නිපුණතාව පරීක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතුය. එමෙන්ම එවැනි උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කටයුතුවලදී අවශ්‍ය වන මෙවලම් හා උපකරණ ඔහුගේ කර්මාන්ත ශාලාවේ තිබිය යුතුය. එම පරීක්ෂණයෙන් සමත් වී සහතික ලබා ඇති පුද්ගලයෙකු ආයතනයේ/සමාගමේ කාර්මික නිලධාරී ලෙස නම් කළ හැක.

2.4 පඩි, මිමි, කිරුම් හෝ මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා නිපුණතා පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් 2 වැනි උපලේඛණයේ III කොටසේ සඳහන් ගාස්තු ගෙවිය යුතුය.

2.5 මෙම කොටස යටතේ නිකුත් කරන ලියාපදිංචි කිරීමේ සහතික හෝ ඒවායේ සහතික කළ පිටපත් සඳහා ගෙවිය යුතු ගාස්තු මුදලින් හෝ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ නමට ලියූ චෙක්පතක් මගින් හෝ ගෙවිය යුතුය. එසේ නොමැති නම් වලංගු ආදායම් මුද්දර මගින් ගෙවනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ හෝ ඔහුගේ බලය යටතේ ඒවා අවලංගු කරනු ලැබිය යුතු ය.

**3. කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ මාදිලි/මෝස්තර/සැලසුම් අනුමත කිරීම**

3.1 මෙරට නිෂ්පාදිත හෝ ආනයනිත කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණවල මාදිලි අධ්‍යක්ෂ විසින් අනුමත කළ යුතුය. මාදිලි අනුමැතිය සඳහා 3 වන උපලේඛනයේ සඳහන් ගාස්තු සමග අධ්‍යක්ෂවරයා නිශ්චය කරන ආකෘති පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතු ය.

3.2 ඉල්ලුම් කළ මාදිලිය ප්‍රතික්ෂේප වුවහොත් නිවැරදි අලුත් කළ උපකරණය හෝ එම මාදිලියේ වෙනත් නිවැරදි උපකරණයක් හේ අනුමැතිය සඳහා නැවත ඉදිරිපත් කළ හැකිය. නැවත ඉදිරිපත් කරන සෑම වාරයක් සඳහාම අයකළ ගාස්තුවෙන් 20% ක මුදලක් ගෙවිය යුතු ය.

**4. කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ අංක ශෝධනය**

4.1 කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ අංක ශෝධනය සඳහා 4 වන උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවිය යුතු ය.

4.2 ක්ෂේත්‍ර අංක ශෝධනවලදී 4 වන උපලේඛනයේ සඳහන් ගාස්තු පදනම් කරගත් අමතර ගාස්තුවක්, උපකරණ ප්‍රවාහන වියදම් සහ නිලධාරීන්ගේ සංයුක්ත දීමනා ගෙවිය යුතු ය.

4.3 අධ්‍යක්ෂවරයා නියම කරනු ලබන ආකාරයට අංක ශෝධන සහතිකයක් සෑම උපකරණයක් සඳහාම නිකුත් කරනු ලැබිය යුතු ය.

5. ඉල්ලීම මත සිදු කරන පෙර ඇසුරුම් පරීක්ෂාව

5.1 5 වන උපලේඛනයේ නියම කර ඇති ආකාරයට පෙර ඇසුරුම් පරීක්ෂාව සඳහා ගාස්තු ගෙවිය යුතු ය.

5.2 ක්ෂේත්‍රයේ කරනු ලබන පරීක්ෂණවලදී උපකරණ ප්‍රවාහන වියදම් සහ නිලධාරීන්ගේ සංයුක්ත දීමනා ගෙවිය යුතුය.

5.3 එක් එක් පරීක්ෂාව සඳහා අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන සහතිකයක් නිකුත් කළ යුතු ය.

**1 වැනි උපලේඛනයේ I වැනි කොටස (1.1 වැනි නියෝගය)**

1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 60 (2) (ක) වගන්තිය

**කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ පරීක්ෂා කිරීම හා සත්‍යාක්ෂණය කිරීම සඳහා ගාස්තු**

| | රු. ශත |
|---|---|
| (අ) දිග පිළිබඳ මිමි | |
| සෑම මීටරයක් හෝ ඉන් කොටසක් සඳහා | 40.00 |
| (ආ) ධාරිතාව පිළිබඳ මිමි | |
| 1 වැනි ගණය - උප බෙදුම් රහිත මිමි | |
| (i) ලීටර් 100 නොඉක්මවන විට සෑම ලීටරයක් හෝ ඉන් කොටසක් සඳහා | 20.00 |
| (ii) ලීටර් 100 ඉක්මවන විට | |
| (1) මුල් ලීටර් 100 සඳහා | 2000.00 |
| (2) අතිරේක ලීටර් 100ක් හෝ ඉන් කොටසක් සඳහා | 150.00 |
| 2 වැනි ගණය - උප බෙදුම් සහිත මිමි | |
| 1 වැනි ගණයේ සඳහන් කළ ගාස්තුවට අමතරව 10% ක ගාස්තුවක් එක් එක් උපබෙදුම සඳහා අය කළ යුතු ය. | |
| 3 වැනි ගණය - මත්පැන් මැනීම සඳහා භාවිතා කරන මිමි | |
| (i) සෑම ලීටරයක් හෝ ඉන් කොටසක් සඳහා | 500.00 |
| (ii) මත්පැන් මැනීම සඳහා භාවිතා කරන උපකරණ | 2000.00 |
| 4 වැනි ගණය - ඉන්ධන බෙදා හැරීමේ උපකරණ | |
| ඉන්ධන බෙදා හැරීමේ යන්ත්‍ර | |
| (i) දියර/වායු ඉන්ධන සඳහා | 2500.00 |
| (ii) ස්නේහක තෙල් සඳහා | 1000.00 |
| (iii) බවුසර් | |
| ලීටර් 3300 දක්වා | 1000.00 |
| වැඩිවන ලීටර් 3300 ක් හෝ ඉන් කොටසක් සඳහා | 1000.00 |

සටහන : මිල ගණනය කිරීම, මුද්‍රණය කිරීම වැනි අතිරේක උපාංග සමග මිනුම් යන්ත්‍ර මුද්‍රා කිරීමේදී එක් එක් අතිරේක උපාංගයක් සඳහා ඉහත සඳහන් ගාස්තුවට අමතරව 10% ක අධිභාරයක් අයකළ යුතු ය.

| | |
|---|---|
| (ඇ) සාමාන්‍ය වෙළඳාම සඳහා භාවිතා කරන පඩි | |
| i. කිලෝ ග්‍රෑම් 2 හෝ ඊට අඩු සෑම පඩියක් සඳහා | 20.00 |
| ii. කිලෝ ග්‍රෑම් 2 ට වැඩි සෑම පඩියක් සඳහා | 40.00 |

| | |
|---|---|
| (ඇ) රසායනඥයන්, ඖෂධ සංයෝජකයන් සහ රන්කරුවන් භාවිතා කරන පඩි | රු ශත |
| (ඕ. අයි. එම්. එල්. $F_1$, $F_2$, $M_1$ පන්තිය සහ $M_2$ පන්තිය) සෑම පඩියක් සඳහාම | 100.00 |
| (ඉ) කිරුම් උපකරන (III සහ IIII වැනි පන්ති) | |
| 1 වැනි ගණය - ක්‍රමාංකනය නොකරන ලද කිරුම් යන්ත්‍ර | |
| තැටි තරාදි | |
| i. කිලෝ ග්‍රෑම් 5 ක් හෝ ඉන් කොටසක් සඳහා | 40.00 |
| ii. අතිරේක කිලෝ ග්‍රෑම් 5 ක් හෝ ඉන් කොටසක් සඳහා | 40.00 |
| කවුන්ටර් තරාදි | |
| i. කිලෝ ග්‍රෑම් 5 ක් හෝ ඉන් කොටසක් සඳහා | 80.00 |
| ii. අතිරේක කිලෝ ග්‍රෑම් 5 ක් හෝ ඉන් කොටසක් සඳහා | 80.00 |
| 2 වැනි ගණය - ක්‍රමාංකිත උපකරණ (III වැනි පන්තිය, ප්‍රතිසම දර්ශක) | |
| i. කිලෝ ග්‍රෑම් 20 නොඉක්මවන | 300.00 |
| ii. කිලෝ ග්‍රෑම් 20 ඉක්මවන නමුත් කිලෝ ග්‍රෑම් 100 නොඉක්මවන | 500.00 |
| iii. කිලෝ ග්‍රෑම් 100 ඉක්මවන නමුත් කිලෝ ග්‍රෑම් 500 නොඉක්මවන | 800.00 |
| iv. කිලෝ ග්‍රෑම් 500 ඉක්මවන නමුත් කිලෝ ග්‍රෑම් 1000 නොඉක්මවන | 1000.00 |
| v. කිලෝ ග්‍රෑම් 1000 ඉක්මවන විට එක් එක් කිලෝ ග්‍රෑම් 1000 හෝ ඉන් කොටසක් සඳහා | 800.00 |
| 3 වැනි ගණය - ක්‍රමාංකිත උපකරණ (III වැනි පන්තිය, සංඛ්‍යාක දර්ශක) | |
| i. කිලෝ ග්‍රෑම් 20 නොඉක්මවන | 1000.00 |
| ii. කිලෝ ග්‍රෑම් 20 ඉක්මවන නමුත් කිලෝ ග්‍රෑම් 100 නොඉක්මවන | 1200.00 |
| iii. කිලෝ ග්‍රෑම් 100 ඉක්මවන නමුත් කිලෝ ග්‍රෑම් 500 නොඉක්මවන | 1500.00 |
| iv. කිලෝ ග්‍රෑම් 500 ඉක්මවන නමුත් කිලෝ ග්‍රෑම් 1000 නොඉක්මවන | 1800.00 |
| v. කිලෝ ග්‍රෑම් 1000 ඉක්මවන විට එක් එක් කිලෝ ග්‍රෑම් 1000 හෝ ඉන් කොටසක් සඳහා | 900.00 |

සටහන : මිල ගණනය කිරීම, මුද්‍රණය කිරීම වැනි අතිරේක උපාංග සමග කිරුම් යන්ත්‍ර මුද්‍රා කිරීමේදී එක් එක් අතිරේක උපාංගයක් සඳහා ඉහත සඳහන් ගාස්තුවට අමතරව 10% ක අධිභාරයක් අයකළ යුතු ය.

| | |
|---|---|
| (ඊ) II පන්තියේ කිරුම් උපකරණ | |
| (i) සෑම ක්‍රමාංකිත නොවන උපකරණයක් සඳහා | 1000.00 |
| (ii) සෑම ක්‍රමාංකිත උපකරණයක් සඳහා | 2500.00 |

සටහන : මිල ගණනය කිරීම, මුද්‍රණය කිරීම වැනි අතිරේක උපාංග සමග කිරුම් යන්ත්‍ර මුද්‍රා කිරීමේදී එක් එක් අතිරේක උපාංගයක් සඳහා ඉහත සඳහන් ගාස්තුවට අමතරව 10% ක අධිභාරයක් අයකළ යුතු ය.

| | |
|---|---|
| (උ) I පන්තියේ කිරුම් උපකරණ | |
| සෑම උපකරණයක් සඳහාම | 8000.00 |
| (ඌ) 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 30 වගන්තිය යටතේ සත්‍යාක්ෂණයන් සඳහා ගාස්තු | |
| (i) වාහනවලින් නිකුත් වන දුම් පරීක්ෂා කිරීමේ උපකරණ | 5000.00 |
| (ii) වාහන වේගය මැනීමේ උපකරණ | 2000.00 |

### 1 වැනි උපලේඛනයේ II වැනි කොටස (1.3 වැනි නියෝගය)

1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 23 වගන්තිය

**කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණවලට මුද්‍රා තැබිය යුතු සත්‍යාක්ෂණය කිරීමේ සලකුණ**



n = 3,4,5,6 ................

අධ්‍යක්ෂවරයා විසින් එක් එක් පරීක්ෂකවරයාට වෙන් කළ අංකය n නම් වේ.

**කිරුම් හා මිනුම් උපකරණවල ඇලවිය යුතු සත්‍යාක්ෂණ සහතිකය**
**(අවශ්‍ය අවස්ථාවල දී)**

| | | |
|---|---|---|
| මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් සත්‍යාක්ෂණය කරන ලදී.<br>නො : 101, උද්‍යාන පාර, කොළඹ 05 දුරකථනය : 0112588914 | | |
| | වෙළෙන්දාගේ නම<br><br>ලිපිනය<br><br>දුරකථන අංකය | උපකරණය :<br>නිෂ්පාදක සහ මාදිලිය අංකය<br><br>අනුක්‍රමික අංකය : |
| සත්‍යාක්ෂණ දිනය | පරීක්ෂකවරයාගේ නම | අත්සන |

### 2 වැනි උපලේඛනයේ I වැනි කොටස (2.1 වැනි නියෝගය)

1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 21 වගන්තිය

කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ නිෂ්පාදනය කර විකිණීම, ආනයනය කර විකිණීම, විකිණීම හෝ අලුත් වැඩියාව සඳහා ලියාපදිංචි ගාස්තු

(අ) නිෂ්පාදනය කර විකිණීම සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු

| | | රු. ශත |
|---|---|---|
| i. | ලී වලින් හෝ ලෝහවලින් තනන ලද දිග මැනීමේ හෝ ධාරිතාව මැනීමේ මිමි | 1000.00 |
| ii. | පඩි | 2000.00 |
| iii. | තරාදි දඬු | 2000.00 |
| iv. | දුනු තරාදි | 2000.00 |
| v. | සමබර තරාදි | 2000.00 |
| vi. | වේදිකා තරාදි (යාන්ත්‍රික) | 2000.00 |
| vii. | පාලම් තරාදි (යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික) | 7500.00 |
| viii. | ඉලෙක්ට්‍රොනික කිරුම් උපකරණ | 3000.00 |
| ix. | ඉන්ධන පිරවුම් උපකරණ | 3000.00 |
| x. | විද්‍යුත් මිනුම් උපකරණ | 3000.00 |

(ආ) කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ ආනයනය කර විකිණීම සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු

| | | රු. ශත |
|---|---|---|
| i. | ලී වලින් හෝ ලෝහවලින් තනන ලද දිග මැනීමේ හෝ ධාරිතාව මැනීමේ මිම් | 2000.00 |
| ii. | පඩි | 4000.00 |
| iii. | තරාදි දඬු | 4000.00 |
| iv. | දුනු තරාදි | 4000.00 |
| v. | සමබර තරාදි | 4000.00 |
| vi. | වේදිකා තරාදි (යාන්ත්‍රික) | 4000.00 |
| vii. | පාලම් තරාදි (යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික) | 15000.00 |
| viii. | ඉලෙක්ට්‍රොනික කිරුම් උපකරණ | 6000.00 |
| ix. | ඉන්ධන පිරවුම් උපකරණ | 6000.00 |
| x. | විද්‍යුත් මිනුම් උපකරණ | 6000.00 |

(ඇ) විකිණීම සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු

| | | රු. ශත |
|---|---|---|
| i. | කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරන | 600.00 |

(ඈ) අලුත් වැඩියා සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු
(අලුත් වැඩියා කරන්නා, ආයතනයක් හෝ වැඩ කණ්ඩායමක් නම් පහත සටහන බලන්න)

| | | රු. ශත |
|---|---|---|
| i. | මිම් | 600.00 |
| ii. | තරාදි දඬු සහ පඩි | 600.00 |
| iii. | දුනු තරාදි | 600.00 |
| iv. | සමබර තරාදි | 600.00 |
| v. | වේදිකා තරාදි (යාන්ත්‍රික) | 600.00 |
| vi. | පාලම් තරාදි (යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික) | 5000.00 |
| vii. | සියලුම යාන්ත්‍රික කිරුම් උපකරණ (පාලම් තරාදි හැර) | 3000.00 |
| viii. | ඉලෙක්ට්‍රොනික කිරුම් උපකරණ (පාලම් තරාදි හැර) | 3000.00 |
| ix. | ඉන්ධන පිරවුම් උපකරණ | 3000.00 |

*සටහන :* යම් ආයතනයක් හෝ පුද්ගලයෙක් වැඩ කණ්ඩායමක් යොදවා කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ අලුත්වැඩියා කරන අවස්ථාවේදී එක් එක් වැඩ කණ්ඩායම වෙනුවෙන් ලියාපදිංචි සහතිකයක් ලබා ගත යුතු ය. වැඩ කණ්ඩායමක් යනු යම් උපකරණයක් අලුත්වැඩියා කිරීමට යොදවනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගලයන් සමූහයක් වේ. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ අදාළ උපකරණ අලුත්වැඩියා කිරීමට නිපුණතාවය ඇති බවට පිළිගත් පුද්ගලයන් යටත් පිරිසෙයින් එක් අයකුවත් සෑම වැඩ කණ්ඩායමකම සිටිය යුතු ය. බලපත්‍ර අයදුම් කිරීමේදී එම පුද්ගලයන්ගේ නම් සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ හැඳුනුම්පත් අංකය කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය. අදාළ පුද්ගලයා වැඩ කණ්ඩායමෙන් ඉවත්වන්නේ නම් හෝ වෙනස් කරන්නේ නම් ඒ බව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ වෙත වහාම දැන්විය යුතුය. ඉවත් වූ පුද්ගලයා වෙනුවෙන් ඉදිරිපත් වන නව පුද්ගලයාගේ නිපුණතාව ද මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ විසින් පිළිගෙන තිබිය යුතු ය.

## 2 වැනි උපලේඛනයේ II වැනි කොටස (2.2 (අ) වැනි නියෝගය)

1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත

යම් පඩියක්, මිම්මක් හෝ කිරුම් මිනුම් උපකරණයක් විකුණන හෝ නිෂ්පාදනය කරන හෝ අලුත්වැඩියා කරන තැනැත්තෙකු හෝ ආයතනයක් ලියාපදිංචි කිරීමේ සහතිකය.

මෙම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් දින සිට ......................... දෙසැම්බර් 31 දක්වා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ........................ යන ස්ථානයේදී .................................... සඳහා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 21 වැනි වගන්තිය යටතේ ................................................ මහතා/මහත්වරුන්/ආයතන ලියාපදිංචි කරන ලදී.

ආයතනයේ කාර්මික නිලධාරියා ලෙස ............................................ මහතා/මහත්මිය/මහත්වරුන් ලියාපදිංචි කරන ලදී.

......................................................
අධ්‍යක්ෂ

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

දිනය

ලියාපදිංචි කිරීමේ කෙන්දේසි

01. බලය දෙන ලද පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණයක් නිෂ්පාදනය කිරීම සඳහා වූ ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නෙකු හෝ ආයතනය විසින් නිෂ්පාදනය කරන සෑම කිරුම් පඩියක්, මිනුමක් හෝ කිරුම් මිනුම් උපකරණයක්ම අධ්‍යක්ෂ විසින් අනුමත කළ මෝස්තරයකට අනුව නිෂ්පාදනය කළ යුතු ය.

02. බලය දෙන ලද පඩි, මිනුම් හෝ කිරුම් උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා වූ ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නෙකු හෝ ආයතනය විසින් අලුත්වැඩියා කරන සෑම කිරුම් පඩියක්, මිනුමක් හෝ කිරුම් මිනුම් උපකරණයක්ම අදාළ රෙගුලාසිවලට සහ පනතට අනුකූලව අලුත්වැඩියා කළ යුතුය.

03. බලය දෙන ලද පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීම සඳහා එක් ස්ථානයක හෝ ආයතනයක ලියාපදිංචි සහතික දරන කාර්මික නිලධාරියෙකු වෙනත් ස්ථානයක හෝ ආයතනයක ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම හෝ අයිතිය පැවරීම නොකළ යුතුය.

04. බලය දෙන ලද පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණයක් විකිණීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නෙකු හෝ ආයතනය විසින් පරීක්ෂකවරයෙකු විසින් මුද්‍රා තබන ලද කිරුම් පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණ පමණක් විකිණීමට හෝ විකිණීම සඳහා ළඟ තබා ගත යුතුය. පරීක්ෂකවරයා විසින් නිකුත් කරන සත්‍යාක්ෂණ සහතිකය උපකරණ මිලදී ගන්නා වෙත නිකුත් කළ යුතු ය.

05. ලියාපදිංචි වූ කාර්මික නිලධාරියා මියගියහොත් හෝ ආයතනයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ රෝගාතුර වීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාවයක් නිසා හෝ සේවය කළ නොහැකි වුවහොත් හෝ ලියාපදිංචි වූ කාර්මික නිලධාරි තනතුර පුරප්පාඩු වූ එවිට එම ආයතනයේ ලියාපදිංචිය අවලංගු වේ.

06. මෙම කොන්දේසි සපුරාලීම පැහැර හැරි අවස්ථාවක සහතිකය දරන්නාගේ හෝ ආයතනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයාට හැකිය.

07. විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන සියලුම බලය දෙන ලද පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණ සමග වලංගු සත්‍යාක්ෂණ සහතිකයක් තිබිය යුතුය.

## 2 වැනි උපලේඛනයේ III වැනි කොටස (2.4 වැනි නියෝගය)

1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතත බලය දෙන ලද කිරුම් පඩි, මිම්, කිරුම් හෝ මිනුම් උපකරණ අලුත් වැඩියාව සඳහා නිපුණතා පරීක්ෂණයට පෙනී සිටීමේ ගාස්තු

| | | රු. ශත |
|---|---|---|
| i. | මිම් | 500.00 |
| ii. | තරාදි දඬු සහ පඩි | 500.00 |
| iii. | දුනු තරාදි | 500.00 |
| iv. | සමබර තරාදි | 500.00 |
| v. | වේදිකා තරාදි | 2000.00 |
| vi. | පාලම් තරාදි (යාන්ත්‍රික/ඉලෙක්ට්‍රොනික) | 2000.00 |
| vii. | ඉලෙක්ට්‍රොනික කිරුම් යන්ත්‍ර | 2000.00 |
| viii. | ඉන්ධන පිරවුම් උපකරණ | 2000.00 |

## 3 වැනි උපලේඛනය (3.1 වැනි නියෝගය)

1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 20 වැනි වගන්තිය
කිරුම් පඩි, මිම්, කිරුම් හෝ මිනුම් උපකරණවල මාදිලි/මෝස්තර/සැලසුම් අනුමැතිය සඳහා ගාස්තු

| | | රු. ශත |
|---|---|---|
| i. | පඩි, මිම්, තරාදි දඬු, දුනු තරාදි | 2000.00 |
| ii. | වේදිකා තරාදි, සමබර තරාදි | 5,000.00 |
| iii. | යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික පාලම් තරාදි | 20,000.00 |
| iv. | ඉලෙක්ට්‍රොනික කිරුම් උපකරණ | 20,000.00 |
| v. | ඉන්ධන පිරවුම් යන්ත්‍ර | 30,000.00 |
| vi. | වාහනවලින් නිකුත් වන දුම් පරීක්ෂා කිරීමේ උපකරණ | 20,000.00 |
| vii. | පරිමාමිතික උපකරණ | 20,000.00 |

සටහන :

1. මිල ගණනය කිරීම, මුද්‍රණය කිරීම වැනි අතිරේක උපාංග ඇති කිරුම් හෝ මිනුම් උපකරණ සඳහා එක් එක් අතිරේක උපාංගයක් සඳහා ඉහත සඳහන් ගාස්තුවට අමතරව 20% ක අධිභාරයක් අයකළ යුතු ය.

2. සෑම නිවැරදි කිරීම් වාරයක් සඳහා ඉහත සඳහන් ගාස්තුවෙන් 20% ක මුදලක් ගෙවා නැවත මාදලි අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. ක්ෂේත්‍රයේ දී පරීක්ෂණ සිදුකරන විට අදාළ උපකරණ ප්‍රවාහන වියදම් සහ සහභාගී වන නිලධාරීන් සඳහා සංයුක්ත දීමනා ද ගෙවිය යුතුය.

## 4 වැනි උපලේඛනය (4.1 වැනි නියෝගය සහ 4.2 වැනි නියෝගය)

### කිරුම් පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණවල අංක ශෝධනය සඳහා ගාස්තු

ක්ෂේත්‍රයේදී කෙරෙන අංක ශෝධන සඳහා පහත ගාස්තුවලට අමතරව 20% ක අතිරේක ගාස්තුවක් ද අදාළ උපකරණ ප්‍රවාහන වියදම් සහ සහභාගි වන නිලධාරීන් සඳහා සංයුක්ත දීමනා ද ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| (අ) | උෂ්ණත්වමිතික අංක ශෝධන | රු. ශත |
| | සායනික උෂ්ණත්වමාන | 500.00 |
| | කාර්මික සහ විද්‍යාගාර උෂ්ණත්වමාන සංඛ්‍යාංක උෂ්ණත්වමාන (Digital Temperature Probe/Digital Thermometer) Dial Thermometer Probe | |
| | තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන සහ ප්‍රතිරෝධ උෂ්ණත්වමාන | |
| | පරාසය | |
| | -50 $^{0}$c සිට 140 $^{0}$c | 1,250.00 |
| | 140 $^{0}$c සිට 700 $^{0}$c | 1,750.00 |
| | 700 $^{0}$c සිට 1200 $^{0}$c* | 2,500.00 |
| | වීදුරු තුල ද්‍රව උෂ්ණත්වමාන* | |
| | Maximum Registered උෂ්ණත්වමාන * | |
| | අර්ධ වශයෙන් ගිල්වන ලද පරාසය | |
| | < - 10 $^{0}$c | 2,000.00 |
| | - 10$^{0}$c සිට 140 $^{0}$c | 1,200.00 |
| | > 140 $^{0}$c | 2,000.00 |
| | සම්පූර්ණයෙන් ගිල්වන ලද | |
| | පරාසය | |
| | <5 $^{0}$c | 2,000.00 |
| | 5 $^{0}$c සිට 90 $^{0}$c | 1,200.00 |
| | > 90 $^{0}$c | 2,000.00 |
| | උපරිම අවම උෂ්ණත්වමාන * | |
| | පරාසය | |
| | - 30 $^{0}$c සිට 50 $^{0}$c * | 2,000.00 |
| | බිත්ති උෂ්ණත්වමාන * | |
| | පරාසය | |
| | - 30 $^{0}$c සිට 50 $^{0}$c* | 2,000.00 |
| | පෘෂ්ඨවල උෂ්ණත්වය මැනීමේ උපකරණ * | 2,000.00 |
| | අධෝරක්ත උෂ්ණත්වමාන * | |
| | පරාසය | |
| | - 15 $^{0}$c සිට 500 $^{0}$c* | 2,000.00 |
| | තෙතමනමානය (Wood)* | 2,000.00 |
| | අධෝරක්ත තෙතමනමානය * | 2,000.00 |
| | තෙතමන තුලාව * | 2,500.00 |
| | සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (සංසන්දන ක්‍රමය)* | |
| | පරාසය | |
| | - 38 $^{0}$c සිට 426 $^{0}$c | 20,000.00 |
| | 0 $^{0}$c සිට 660 $^{0}$c | 20,000.00 |
| | සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය)* | |
| | පරාසය | |
| | - 38 $^{0}$c සිට 426 $^{0}$c | 60,000.00 |
| | 0 $^{0}$c සිට 660 $^{0}$c | 60,000.00 |
| | - 38 $^{0}$c සිට 660 $^{0}$c (සෑම තනි අචල ලක්ෂ්‍යයක් සඳහා) | 10,000.00 |

| | |
|---|---|
| කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන උෂ්ණත්වමාන (සංසන්දන ක්‍රමය)* | *රු. ශත* |
| පරාසය | |
| 50 $^0$c සිට 600 $^0$c | 10,000.00 |
| 600 $^0$c සිට 1200 $^0$c | 14,000.00 |
| කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය)* | |
| පරාසය | |
| < 660 $^0$c (සෑම තනි අචල ලක්ෂ්‍යයක් සඳහා) | 10,000.00 |
| උෂ්ණත්වමිතික තාපත (ද්‍රව සහ වියලි)* | 8,000.00 |
| උෂ්ණත්වමිතික රේඛය (Chart Recorder) * | 4,000.00 |
| විද්‍යාගාර උදුන් (Oven) | 2,400.00 |
| ඔටෝක්ලේව්, ඉන්කියුබේටරය සහ ජල තාපකය | 2,400.00 |
| අධිශීතකරණය සහ ශීතකරණය | |
| තනි කුටීර | 2,400.00 |
| කුටීර දෙක | 2,800.00 |
| අතිරේක සෑම කුටීරයක් සඳහාම | 400.00 |
| ශීත කාමරය (කාමර උෂ්ණත්ව මිනුම්) | 3,200.00 |
| ශීත කාමරය (තාප ස්විච දර්ශකය සහිත පද්ධති) | 4,750.00 |
| තාප ස්විච/පාලක | |
| පරාසය | |
| - 40 $^0$c සිට 140 $^0$c | 2,400.00 |
| 140 $^0$c සිට 700 $^0$c | 2,750.00 |
| සංඛ්‍යාංක ආර්ද්‍රතාමානය* | 4,000.00 |
| තෙත් හා වියලි බල්බ ආර්ද්‍රතාමානය* | 2,000.00 |

*ගෘහස්ථ අංක ශෝධන සඳහා පමණක් අදාළ වේ.

සටහන :

මෙම සියලු ගාස්තු අදාළ වනුයේ අංක ශෝධන ලක්ෂ්‍ය පහක් හෝ ඊට අඩු ගණනක් සඳහා පමණි. සෑම අතිරේක අංක ශෝධන ලක්ෂ්‍යයක් (අවශ්‍ය නම්) සඳහාම මුලු අංක ශෝධන ගාස්තුවෙන් 20% ක අතිරේක ගාස්තුවක් එකතුවේ.

| | |
|---|---|
| (ආ) විද්‍යුත් බලය සහ ශක්තිය සම්බන්ධ අංක ශෝධන සේවා | *රු. ශත* |
| කිලෝ වොට් පැය මීටරය (එකලා) | 1000.00 |
| කිලෝ වොට් පැය මීටරය (තෙකලා) | 1200.00 |
| කිලෝ වෝල්ට් ඇම්පියර් පැය මීටරය (තෙකලා) | 1200.00 |
| ජංගම විද්‍යුත් බලය/ශක්තිය මැනීමේ උපකරණ (එකලා) නිරවද්‍යතා පන්තිය 0.1/0.2/0.05 | 10,000.00 |
| ජංගම විද්‍යුත් බලය/ශක්තිය මැනීමේ උපකරණ (තෙකලා) නිරවද්‍යතා පන්තිය 0.1/0.2/0.05 | 12,000.00 |
| විදුලි මනු පරීක්ෂා කිරීමේ ඇති පද්ධතිවල මීටර (එකලා) | 50,000.00 |
| විදුලි මනු පරීක්ෂා කිරීමේ ඇති පද්ධතිවල මීටර (තෙකලා) | 60,000.00 |
| විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/එකලා) නිරවද්‍යතා පන්තිය 0.1/0.2 | 10,000.00 |
| විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා) නිරවද්‍යතා පන්තිය 0.1/0.2 | 12,000.00 |
| විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/එකලා/ජංගම) | 5,000.00 |
| විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා/ජංගම) | 6,000.00 |

(ඇ) පරිමා සම්බන්ධ අංක ශෝධන සේවා

| බෙදුම් රහිත මිනුම් | රු. ශත |
|---|---|
| මිලිලීටර් 500 දක්වා පරිමාමිතික මිනුම් | 500.00 |
| මිලිලීටර් 500 ඉක්මවන නමුත් ලීටර් 2 හෝ ඊට අඩු | 1,000.00 |
| ලීටර් 2 ඉක්මවන නමුත් ලීටර් 100 හෝ ඊට අඩු පළමු ලීටර 2 සඳහා | 1,040.00 |
| වැඩි වන සෑම ලීටරයක්ම හෝ ඉන් කොටසක් සඳහා | 20.00 |
| ලීටර් 100 ඉක්මවන නමුත් ලීටර් 1000 නොඉක්මවන පරිමාමිතික මිනුම් පළමු ලීටර් 100 සඳහා | 3,200.00 |
| සෑම ලීටර් 100ක් හෝ ඉන් කොටසක් සඳහා | 200.00 |
| ලීටර් 1000 ඉක්මවන පරිමාමිතික මිනුම් පළමු ලීටර් 1000 සඳහා | 5,000.00 |
| වැඩි වන සෑම ලීටර් 1000 ක් හෝ ඉන් කොටසක් සඳහා | 1,000.00 |

*බෙදුම් සහිත මිනුම්*

ඉහත සඳහන් කළ ගාස්තුවලට අමතරව 10% ක ගාස්තුවක් එක් එක් උප බෙදුම සඳහා අය කළ යුතුය.

*මිනුම් සිලින්ඩර*

ලක්ෂ්‍ය තුනක් සඳහා

| | |
|---|---|
| මිලිලීටර් 50 | 500.00 |
| මිලිලීටර් 100 | 600.00 |
| මිලිලීටර් 250 | 700.00 |
| මිලිලීටර් 500 | 800.00 |
| මිලිලීටර් 1000 | 900.00 |
| මිලිලීටර් 2000 | 1000.00 |
| වැඩිවන සෑම අතිරේක ලක්ෂ්‍යයක් සඳහා | 200.00 |

*මාර්ග ටැංකි*

| | |
|---|---|
| පළමු ලීටර් 3300 සඳහා | 3,000.00 |
| අතිරේක ලීටර් 3300 හෝ ඉන් කොටසක් සඳහා | 2,400.00 |
| ප්‍රවාහමාන | 10,000.00 |

*මයික්‍රො පිපෙට්ටු, පිපෙට්ටු, බියුරෙට්ටු : ලක්ෂ්‍ය 3 ක් සඳහා*

| | |
|---|---|
| මයික්‍රොලීටර 1 < පරිමාව <= මිලිලීටර 1 | 2,000.00 |
| මිලිලීටර 1<V<= මිලිලීටර 50 | 2,000.00 |
| මිලිලීටර 50<V<= මිලිලීටර 200 | 2,500.00 |
| අතිරේක ලක්ෂ්‍යක් සඳහා | 200.00 |

(ඇ) ස්කන්ධ හා සම්බන්ධ මිනුම් අංක ශෝධන සේවා
කිරුම් පඩි

| | |
|---|---|
| කිරුම් පඩි (OIML E2 පන්තිය) | රු. ශත |
| M<1g | 2,000.00 |
| 1g<=M<200g | 3,000.00 |
| 200g<=M<=1kg | 2,500.00 |
| 1kg<M<=2kg | 1,500.00 |
| 2kg<M<=10kg | 2,000.00 |
| 10kg<M<=20kg | 4,000.00 |
| කිරුම් පඩි (OIML F1 පන්තිය) | |
| M<1g | 1,500.00 |
| 1g<=M<200g | 2,000.00 |
| 200g<=M<=1kg | 1,750.00 |
| 1kg<M<=2kg | 1,000.00 |
| 2kg<M<=10kg | 1,500.00 |
| 10kg<M<=20kg | 3,000.00 |
| OIML පන්තිය F2/M පන්තිය/සුදු යකඩ කාර්මික කිරුම් පඩි | |
| M<1g | 500.00 |
| 1g<M<200g | 300.00 |
| 100g<M<500g | 500.00 |
| 500g<M<5kg | 1,500.00 |
| 5kg<M<50kg | 2,000.00 |
| අනෙකුත් කාර්මික කිරුම් පඩි | |
| M<1g | 200.00 |
| 1g<=M<200g | 150.00 |
| 200g<=M<500g | 200.00 |
| 500g<=M<5kg | 500.00 |
| 5kg<=M<50kg | 1,000.00 |
| 50kg<M<=1000kg | 1,500.00 |
| 1000kg<M | 3,000.00 |
| කිලෝ ග්‍රෑම් 1000 ඉක්මවන විට වැඩිවන සෑම අතිරේක කිලෝ ග්‍රෑම් 1000 ක් සඳහා | 1,000.00 |
| නිරවද්‍යතා පන්තිය 1 තරාදි | 10,000.00 |
| නිරවද්‍යතා පන්තිය 1I තරාදි | 5,000.00 |
| නිරවද්‍යතා පන්තිය 1II, IIII තරාදි - කඩදාසි තුලා, දොඹකර තුලා, එල්ලන තරාදි, පාලම් තරාදි | |
| උපරිම ධාරිතාව ≤100 kg | 1,500.00 |
| 100 kg< උපරිම ධාරිතාව ≤500 kg | 2,000.00 |
| 500 kg< උපරිම ධාරිතාව ≤ 1000 kg | 2,500.00 |
| 1000 kg< උපරිම ධාරිතාව ≤ 2000 kg | 5,000.00 |
| උපරිම ධාරිතාව කිලෝ ග්‍රෑම් 2000 ඉක්මවන විට වැඩිවන සෑම අතිරේක කිලෝ ග්‍රෑම් 1000ක් හෝ ඉන් කොටසක් සඳහා | 2,000.00 |

| බොත්තම් අඳින යන්ත්‍රය | රු. ශත |
|---|---|
| හොපර් තුලාව | 1,500.00 |
| උපරිම ධාරිතාව ≤ 100 kg | 7,500.00 |
| 100 kg< උපරිම ධාරිතාව ≤ 500 kg | 10,000.00 |
| 500 kg< උපරිම ධාරිතාව ≤ 1000 kg | 15,000.00 |
| උපරිම ධාරිතාව කිලෝ ග්‍රෑම් 1000 ඉක්මවන විට වැඩිවන සෑම අතිරේක කිලෝ ග්‍රෑම් 1000ක් හෝ ඉන් කොටසක් සඳහා | 5,000.00 |
| (ඉ) දිග සම්බන්ධ අංක ශෝධන සේවා | |
| රේඛීය මිනුම් | |
| රූල්/ටේප් මීටර් 1ක් හෝ ඉන් කොටසක් | 1,500.00 |
| ආමාන කුට්ටි | |
| ආමාන කුට්ටි සංසන්දකය භාවිතා කරන විට එක් එක් කුට්ටියක් සඳහා | 700.00 |
| මයික්‍රොමීටර් ඉස්කුරුප්පු ආමානය භාවිතා කරන විට එක් එක් කුට්ටියක් සඳහා | 500.00 |
| ආමාන කුට්ටි භාවිතා කරන විට එක් එක් කුට්ටියක් සඳහා | 500.00 |
| වර්නියර් පරිමාණ | |
| වර්නියර් කැලිපර් | |
| < =200 mm | 2,000.00 |
| > 200 mm | 2,500.00 |
| මයික්‍රොමීටර | |
| < = 25 mm | 1,500.00 |
| > 25 mm <= 150 mm | 2,000.00 |
| > 150 mm | 2,500.00 |
| විෂ්කම්භ ආමාන | |
| 0 < 20 mm | 1,500.00 |
| >20 mm < = 40 mm | 2,000.00 |
| උස ආමාන උපකරණ | 1,500.00 |
| කැලිපර් පරීක්ෂක | 2,000.00 |
| ෆීලර් ආමාන | 2,000.00 |
| ගණකම මැනීමේ ආමාන | 2,000.00 |
| (ඊ) විද්‍යුතය, කාලය හා සංඛ්‍යාතය සම්බන්ධ මිනුම් අංක ශෝධන සේවා | |
| කාණ්ඩය 1 ප්‍රතිසම දර්ශක | |
| වෝල්ට් මීටර්/AC හෝ DC 1000V දක්වා | 1,500.00 |
| වෝල්ට් මීටර්/AC හෝ DC 1000V ට වැඩි | 2,000.00 |
| ඇමීටර්/AC හෝ DC 12A දක්වා | 1,500.00 |
| ඇමීටර්/AC හෝ DC 12A ට වැඩි | 2,000.00 |
| ඕම් මීටර් 100 MΩ දක්වා | 1,500.00 |
| ඕම් මීටර් 100 MΩ ට වැඩි | 2,000.00 |
| කාණ්ඩය 2 සංඛ්‍යාංක දර්ශක | |
| වෝල්ට් මීටර්/AC හෝ DC 1000V දක්වා | 2,000.00 |
| වෝල්ට් මීටර්/AC හෝ DC 1000V ට වැඩි | 2,500.00 |
| ඇමීටර්/AC හෝ DC 12A දක්වා | 2,000.00 |
| ඇමීටර්/AC හෝ DC 12A | 2,500.00 |
| ඕම් මීටර් 100 MΩ දක්වා | 2,000.00 |
| ඕම් මීටර් 100 MΩ ට වැඩි | 2,500.00 |
| බහුමීටරය 6.5 ප්‍රත්‍යාවර්ත/සරල විභව, ප්‍රත්‍යාවර්ත/සරල ධාරා, ප්‍රතිරෝධ | 7,500.00 |
| බහුමීටරය 4.5 සංඛ්‍යාංක ප්‍රත්‍යාවර්ත/සරල විභව, ප්‍රත්‍යාවර්ත/සරල ධාරා, ප්‍රතිරෝධ | 5,000.00 |

| | |
|---|---|
| | රු. ශත |
| ප්‍රතිරෝධ | 2,000.00 |
| කාලය/විරාම සටිකාව | 2,000.00 |
| සංඛ්‍යාතය/ටැකෝමීටරය | 2,000.00 |
| දෝලනේක්ෂය | |
| එක් එක් චැනලය/තරංග වර්ගය සඳහා | 2,000.00 |
| තරංග ජනකය | |
| එක් එක් චැනලය/තරංග වර්ගය සඳහා | 2,000.00 |

(උ) රික්ත සහ පීඩනය සම්බන්ධ අංක ශෝධන සේවා

| | |
|---|---|
| පීඩන ආමාන | |
| ලක්ෂ්‍යය 5 ක් සඳහා | 1,500.00 |
| ලක්ෂ්‍යය 5 ට වැඩිවන සෑම එක් ලක්ෂ්‍යයක් සඳහා | 100.00 |
| ස්පිග්මෝමැනෝමීටරය | 1,000.00 |
| ලක්ෂ්‍ය 5 ට වැඩි වන සෑම එක් ලක්ෂ්‍යයක් සඳහා | 100.00 |
| සංඛ්‍යාංක රුධිර පීඩන මානය | |
| ලක්ෂ්‍යය 5 ක් සඳහා | 1,500.00 |
| ලක්ෂ්‍යය 5 ට වැඩිවන සෑම එක් ලක්ෂ්‍යයක් සඳහා | 100.00 |

### 5 වන උපලේඛනය (5.1 වැනි නියෝගය)

ක්ෂේත්‍රයේ කරනු ලබන පරීක්ෂණවලදී උපකරණ ප්‍රවාහන වියදම් සහ නිලධාරීන්ගේ සංයුක්ත දීමනා ගෙවිය යුතුය.

| බර 1kg නොඉක්මවන | රු. ශත |
|---|---|
| නියැදිය <= 12 | 600.00 |
| නියැදිය <= 32 | 1,600.00 |
| නියැදිය <= 80 | 4,000.00 |
| | |
| බර 1kg ඉක්මවන නමුත් 10kg නොඉක්මවන | |
| නියැදිය <= 12 | 1,200.00 |
| නියැදිය <= 32 | 3,200.00 |
| නියැදිය <= 80 | 8,000.00 |
| | |
| බර 10kg ඉක්මවන නමුත් 20kg නොඉක්මවන | |
| නියැදිය <= 12 | 1,800.00 |
| නියැදිය <= 32 | 4,800.00 |
| නියැදිය <= 80 | 12,000.00 |
| | |
| බර 20kg ඉක්මවන නමුත් 50kg නොඉක්මවන | |
| නියැදිය <= 12 | 3,000.00 |
| නියැදිය <= 32 | 8,000.00 |
| නියැදිය <= 80 | 20,000.00 |
| | |
| බර 50kg ඉක්මවන නමුත් 100kg නොඉක්මවන | |
| නියැදිය <= 12 | 5,000.00 |
| නියැදිය <= 32 | 10,000.00 |
| නියැදිය <= 80 | 30,000.00 |

| ධාරිතාව 500ml නොඉක්මවන | රු. ශත |
|---|---|
| නියැදිය <= 12 | 600.00 |
| නියැදිය <= 32 | 1,600.00 |
| නියැදිය <= 80 | 4,000.00 |
| | |
| ධාරිතාව 500ml ඉක්මවන නමුත් 1000ml නොඉක්මවන | |
| නියැදිය <= 12 | 1,200.00 |
| නියැදිය <= 32 | 3,200.00 |
| නියැදිය <= 80 | 8,000.00 |
| | |
| ධාරිතාව 1000ml ඉක්මවන නමුත් 2000ml නොඉක්මවන | |
| නියැදිය <= 12 | 1,800.00 |
| නියැදිය <= 32 | 4,800.00 |
| නියැදිය <= 80 | 12,000.00 |
| | |
| ධාරිතාව 2000ml ඉක්මවන නමුත් 5000ml නොඉක්මවන | |
| නියැදිය <= 12 | 3,000.00 |
| නියැදිය <= 32 | 8,000.00 |
| නියැදිය <= 80 | 20,000.00 |
| | |
| ධාරිතාව 5000ml ඉක්මවන නමුත් 10000ml නොඉක්මවන | |
| නියැදිය <= 12 | 5,000.00 |
| නියැදිය <= 32 | 10,000.00 |
| නියැදිය <= 80 | 30,000.00 |

07 - 789

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.